

# සදාතන පැතුමක් ය, මැන්ඩෙලා

මෙලොවින් ඔබ සමුගනී ද විගසින්?
සමහර විට,
නොවිය හැක ඇතැම් විට.
ඒත් ඔබේ එළිය නිවන්නට
නුපුලුවන අඳුරට
හැම හදකම අපේ ඔබ වෙසෙන නිසා
අපව සාඩම්බර කළ.
සිරකරුවෙකු, රටක නායකයෙකු
හඩක් නැති සුවහසකගේ රාජදූතයෙකු ලෙස
ඔබ අප අතැ'රයන්නේ අභිමානයෙන්.

විසි හත්වසක් කුඩු කළ වහලෙක්,
බරපතල වැඩ ඇතිව ගල් කැඩූ.
ඒත්,
කිසිවෙකුට බැහැ බිඳින්නට
ඔබේ අභිමානය සහ මිනිස්කම.
ඒ වෙනුවට,
කැඩුවෙහි ය ඔබ වර්ණ භේදය සඳහටම
පිටකොන්දක් ඇතිව සෘජුව සිටගෙන
ඔබේ ඉරණමේ අධිපතිව
ඔබේ ආත්මයේ සෙන්පතිව

ඔබමෙන්ම මා ද
හිංසා, පීඩා, ප්‍රයෝග පරයමින්
දශකයක් ගෙව්වා තනියෙන්ම,
දඟගේක.
යටත් නොවෙමින් හිසකෙලින් තබාගෙන
අපේක්ෂා සහ ප්‍රාර්ථනාවන් ගෙන් පිරිපුන් ව
මානව ප්‍රජාවේ
වඩා යහපත් හෙටක් සහ යුක්තිය ගැන
සිහිනමවමින.

සුරකිමින් ඔබේ පරමාදර්ශ
අධිකාරයේ සිට සුසිරිතටත්
අවි බලේ සිට සුසංවාදයටත්
විතැන්විය ඔබ.
ඒත්,
නිදහසේ සහ අභිමානයේ ඉමට
ඔබේ ජනයා කැන්දන
සාමයේ අරගලය අත නොහැර.

පිවිස සුසිරිතෙන් අධිකාරයට
නසා අපේ පුරුෂාර්ථ
කඳුළ සහ උදහසින් පිරි දේශයක් තනන්නට
මගේ සගයන් තතනනු දකින සඳ
මගේ දිවියම නාස්තියක් දූ යි
සිතෙයි සමහර විටෙක.

පැතිරේ අන්ධකාරයේ වළාකුළු
භීතියේ ඝන මීදුම්
මගේ දේශය වසා.
විනාශයේ සහ භීතියේ
කාලයක ඇවෑමෙන්
හදා ඇත වර්ණභේදවාදයේ දේශයක්.

යහපත් හෙටක් ගැන දෑස් දල්වූ
මහාපුරුෂයෙකු වූඔබ
වැනසුවෙහි ය වර්ණභේදවාදය
ඔබේ දේශයේ.
පැතුම් දේශයක් කළෙහි ය
ඔබේ ජනයාට.
ඒත්,
ඔබ නැති දකුණු අප්‍රිකාවක
ඔබේ සගයන්වේ ද සත්‍යවාදීන්
ඔබේ පරමාදර්ශයන් හට?

අපෙන් මතු පරම්පරාවෝ සුදුස්සෝ වියයුත්තෝය
වඩා යහපත් විනීත හෙටකට.
නූපන් ලොව ද අනුප්‍රාණකරවන
ඔබේ පරමාදර්ශ මතුවට ද දිදුළන නිසාවෙන්
ඔබේ නාමය නොමැකේවා ය යන්න
වෙයි මගේආශාව, වෙයි මගේ පැතුම.

සූරාකෑමෙන් සහ අසාධාරණයෙන්
අපව ගෙන යන්නට
නිදහසේ සහයුක්තියේ මාවතට,
කොපමණ නම් මැන්ඩෙලාවන්
ඕනෑවේ ද ලෝකයාට?
මැන්ඩෙලා, අපේ මැන්ඩෙලා
සදා වැජඹේ මතකයේ ඔබ
ඔබේ පරමාදර්ශය
කිසිදා හැරනොදමත්වා යන්න
සදාතන පැතුමය, අපේ ජීවිතයේ!!

**ලයනල් බෝපගේ**
ඔස්ට්‍රේලියාවේ මෙල්බන් නුවරදී
2013 ජූනි 25 වන ද
සිංහල පරිවර්තනය
**ගාමිණී වියන්ගොඩ**

## To my glass of wine in front of my love

Asanki Ranaweera



Oh heavenly thirst-quencher
You ascend as a perfume
Tiptoe through nostrils
Tickle the soft throat
kiss heart
I adore you
but,
may I be only me
just until he leaves

## If you were here..!!!

Nadie Upekshinie Jayamanna



How would life be today
If you were here..!!!

It's being six long years
And so much have changed
Since you've gone
I know tears have dried
And pain has slowly subside
But your memories still alive
And no one ever could fill that place
Where you always stood tall

Each year this date
Reminds of the sorrow you left behind
Reminds of the pain you went thr'
And reminds how much we all miss you
Most of all reminds ...life is a oneway road....

I know I can't turn back time
But like a little girl I always wish I could
So many things I wish I could change
But I know it's impossible to change the past
I know I was the blacksheep
But how can you blame when I'm just your way
Carefree and happy…..isn't life all about thy

I wish you are here
To see how I have changed in time
To see what I'm doing right now
Something you always wanted me to be

Thaththa,
Where ever you are right now
I know you are happy and fine
And I pray that we will meet again
In our journey in Sansar

## පොසොන් උදාව

අතුල විජේවික්‍රම



මිහින්තලා ලතා අගින්
ඇදී ඇලී  පවන් රොදින්
රහත් තෙරුන් දෙසු වදන්
ගලා ඇදෙනවා

තැවී දැවී ගිය හදවත
සිහිල් කරනවා
පවන් සලනවා

ජය ශ්‍රී බෝ අතු අතරින්
ගලා වැටෙන පොසොන් සඳින්
මළුව පුරා සුදෝ සුදට
රටා වියනවා

ගතේ විඩාබර දුරුවී
ගිමන් නිවනවා
නැවුම් කරනවා

සමාධි පිළිමය අභියස
පිපී දිලෙන පහන් සිළුව
හිතේ අඳුර දුරු කරලා
එළිය කරනවා

නිවන් දොරට යන මාවත
හිතේ අඳිනවා
මැවී පෙනෙනවා




## විජය පුවත රාජාවලියෙන් ඉගෙන ගනිමු

(මෙය පොතේ ඇති සැටියට ම ලියූවකි)

*..... රාවණාගේ යුද්ධයෙන් පසුව යකුන්ඩ අත ඇරී එක්දහස් අටසිය සූසාළිස් අවිරුද්දක් ගියාහ. - අද එතැන සිට.....*

අප බුදුන් බුදුව දසදහසක් සක්වළ එක මඟුල් ගෙයක් සේ සව්සතුන් මොක්පුර හැර රජගහ නුවර වේළුවනාරාමයේ වැඩ වසනා දිනයෙහි සිරිලක යකුන් ඉඳින බව දිවසින් බලා පෙර බුදු වූ තුන්දෙනා වහන්සේ ගේ ශාසනය පිහිටුවා දාගොප් බඳවා සතුන් උපන් බව දිවනෙතින් දැක වේළුවනාරාමයෙන් අහසට පැන නැඟී බුදු වූ නව වන මස පිරී ගිය දුරුතු මස් පුර ගුරු දින පුසේ නැකතින් පොහෝ දින සිරිලකට වැඩමවා මයියඩිගණයේ අහසින් වැඩ සිටි යකුන්ගෙන් අවකාශ ඉල්වාගෙන ජය කොන්තය පිහිටුවන්ඩ බිම ගෙන මහත් අන්ධකාරයක් මවා බුදුරැස් දස දහසක් සක්වළ ද බඹලොව ද නාලොව ද එක පැහැර රතින් සුදින් නිලින් විහිදුවා සිට ගිනිකඳක් මවා පෑ සේක. එකල යක් සෙනඟ මූදු වෙරළට වැද බියපත්ව අඬා විලාප කී විට තමන් වහන්සේගේ ආනුභාවයෙන් යග්ගිරි දිවයින ගෙන්නවා යක්ෂයින් එහි පිහිටුවා පෙර තිබූ තැනට යන්ඩ අධිෂ්ඨාන කළ සේක. යග්ගිරි දිවයින පෙර තිබූ තැනට ගියා හ. බුදු වූ සවෙනි අවුරුදු වෙසඟ පුර පසළොස්වකින් කැලණිපුරයට වැඩමවා කැලණිපුර නාග යුද්ධය සමන්නා මිණිපළඟ බුදුන්ඩ නයි පිදු විට තුන් දවසක් වැඩ ඉඳ කැලණියේ නයින්ඩ බණ වදාරා දෙව්රම් වෙහෙරට වැඩි සේක.

තුන් වෙනි වර බුදු වූ නව වෙනි අවිරුදු පිරිගිය විට ඇසළ මස පුර පසළොස්වක් ලත් දින උත්‍රසලේ නැකතින් සොළොස්මස්ථානයේ මොහොතක් මොහොතක් කල් සොළොස් තැනක වැඩ සිට ජේතවනාරාමයට වැඩි සේක. (ඉවසිල්ලෙන් කියවන්න. අදහස ගලපා ගැනීම දුශ්කරයි. හිස කැරකෙන්නට පටන් ගන්නට බැරි නැත.)

*පිටපත් කෙලේ වි.ක. ධර්මබන්ධු*